Lesson 08

# සාමාන්‍යයෙන් කරන ක්‍රියා

අදාල ක්‍රියාව “කරනවා”

අපි මුලින්ම උදාහරණ විදියට ගනිමු උදේ අවදි උන වෙලාවේ ඉඳලා රාත්‍රී නින්දට යනකල් අපි සාමාන්‍යයෙන් කරන ක්‍රියාකාරකම්; ඒ කියන්නේ අපේ දින චර්යාව. අපි බලමු කොහොමද ඔබේ දින චර්යාව තුල සාමාන්‍යයෙන් කරන කියන දෑ ඉංග්‍රීසියෙන් කියන්නේ කියල, මොකද සමහරුන්ට ඉංග්‍රීසි පුළුවන් කියල කිව්වත් ඒ වගේ සරල දෙයක් පවා සමහර අවස්ථා වල නිවැරදිව කියාගන්න බැරිනිසා

මෙහිදී මතක තබා ගත යුතුයි ඉංග්‍රීසි භාෂාවේ වාක්‍යයක් සෑදීමේදී සාමාන්‍යයයෙන් මුලට එන්නේ කතෘ. දෙවනුවට ක්‍රියාව. ඊට පසුව කර්මය සහ ඉතිරි අනෙකුත් පද

කතෘ +ක්‍රියාව +කර්මය +ඉතිරිය

I getup at 6 in the mornig
අයි ගෙට් අප් (ගෙටප්) ඇට් සික්ස් ඉන් ද මෝ(ර්)නින්
මම නැගිටින්නේ උදේ 6 ට
[ get up (ගෙටප්) කියන්නේ ඇඳෙන් නැගිටිනවා.නමුත් නින්දෙන් අවදි වෙනවට කියන්නේ wake up(වේකප්) .මේ දෙකම අයත් වෙන්නේ යුගල ක්‍රියාපද වලට ]

Then, I take a bath / shower
දෙන් අයි ටේක් අ බාත් / ෂව(ර්)
ඊළඟට මම නානවා

I take my breakfast at about 6.30
අයි ටේක් මයි බ්‍රේක්ෆස්ට් ඇට් අබවුට් සික්ස් ත(ර්)ටි
මම උදේ ආහාරය ගන්නවා 6.30 ට විතර

Then , I get ready to go to work
දෙන් අයි ගෙට් රෙඩි ටු ගෝ ටු ව(ර්)ක්
ඊළඟට මම ලැහැස්ති වෙනවා වැඩට යන්න

Then, I get dressed to go to work
දෙන් අයි ගෙට් ඩ්‍රෙස්ඩ් ටු ගෝ ටු ව(ර්)ක්
ඊළඟට මම ඇඳගන්නවා වැඩට යන්න

I leave home at about 7
අයි ලීව් හෝම් ඇට් අබවුට් සෙවන්
මම හතට විතර ගෙදරින් පිටත් වෙනවා

I normally take the bus from my village/ home
අයි නෝමලි ටේක් ද බස් ෆ්‍රොම් මයි විලේජ් / හෝම්
මම සාමාන්‍යයෙන් බස් එකේ යන්නේ ගමේ ඉඳලා /ගෙදර ඉඳලා

I go by bus/ train / bike / car
අයි ගෝ බයි බස් /ට්‍රේන් / බයික් /කා(ර්)
මම යන්නේ බස් එකේ /කෝච්චියේ /බයික් එකේ / කා(ර්) එකේ

I arrive at the office by 8
අයි අරයිව් ඇට් දි ඔෆිස් බයි එයිට්
මම 8 වෙනකොට ඔෆිස් එකට ලඟාවෙනවා

I start work at 8.30
අයි ස්ටා(ර්)ට් ව(ර්)ක් ඇට් එයිට් ත(ර්)ටි
මම 8.30ට වැඩ පටන් ගන්නවා

We take our lunch between 12.30 and 1.30
වී ටේක් අ(වා)ර් ලන්ච් බිට්වීන් 12.30 ඇන්ඩ් 1.30
අපි ලන්ච් එක ගන්නවා 12.30 ත් 1.30 ත් අතර

We take a tea break at 3.15
වී ටේක් අ ටී බ්‍රේක් ඇට් ත්‍රී ෆිෆ්ටීන්
අපි තුනයි කාලට තේ විවේකය ගන්නවා

I finish work at 4.30
අයි ෆිනිෂ් ව(ර්)ක් ඇට් ෆෝ ත(ර්)ටි
මම වැඩ ඉවර කරනවා හතරයි තිහට

I leave the office at about 4.45
අයි ලීව් දි ඔෆිස් ඇට් අබවුට් ෆෝ ෆො(ර්)ටි ෆයිව්
මම 4.45 ට විතර ඔෆිස් එකෙන් පිටත් වෙනවා

I come back home by 5.30
අයි කම් බැක් හෝම් බයි ෆයිව් ත(ර්)ටි
මම ගෙදර එනවා පහමාර වෙනකොට

I take a shower.Then I have my evening tea
අයි ටේක් අ ෂව(ර්) දෙන් අයි හෑව් මයි ඊව්න් ටී
මම ඇඟපත හෝදගන්නවා. ඊලඟට මම හැන්දෑවේ ටී එක බොනවා

Next, I watch T.V / listen to music / read newspapers.
නෙක්ස්ට්, අයි වොච් ටී .වී /ලිස්න් ටු මියුසික් /රීඩ් නිව්ස් පේප(ර්)ස්
ඊළඟට,මම ටී.වී. බලනවා/ මියුසික් අහනවා/පත්තර බලනවා

I take my dinner at about 8.30
අයි ටේක් මයි ඩින(ර්) ඇට් අබවුට් එයිට් ත(ර්)ටි
මම 8.30 ට විතර මගේ රෑ කෑම ගන්නවා

Then I prepare things for the next day
දෙන් අයි ප්‍රිපෙයා(ර් ) තිංග්ස් ෆෝ ද නෙක්ස්ට් ඩේ
ඊළඟට, මම ඊළඟ දවසට කලමනා ලැහැස්ති කරනවා (Things -දේවල්. මෙතන ඉන් අදහස් වෙන්නෙ අවශ්‍ය දේවල් කියන එක)

දැන් මේ සියළුම ක්‍රියාවන් ගැන බලද්දී ඒ එකක්වත් මේ වෙලාවේ ,එනම් කතාකරන මොහොතේදී සිදුවන ඒවා නෙවෙයි. මේ වාක්‍ය වලින් අදහස් වෙන්නේ එම ක්‍රියාවන් සාමාන්‍යයෙන් සිදු කරනවා කියන එක. එවැනි ක්‍රියාවන් ප්‍රකාශ කරන්න අපි භාවිතා කරන්නෙ පසුගිය පාඩමේ සඳහන් ක්‍රියාපද සටහනේ පළමු තීරයේ ක්‍රියාපද. එම රූපය සැලකෙන්නේ ක්‍රියාපදයේ මූලික රූපය කියලා. ඒ කියන්නේ අදාල ක්‍රියාව “කරනවා” කියන අදහස දෙන රූපය. මෙලෙස සාමාන්‍ය ක්‍රියාවන් ප්‍රකාශ වන tense එක හදුන්වන්නෙ simple present tense - සරල වර්තමාන කාලය කියල

**මෙහිදී අදාළ වන ව්‍යාකරණ නීතියක් තිබෙනවා**

- කර්තෘ බහුවචන නම් ක්‍රියාපදය එලෙසින්ම යෙදෙනවා ( I සහ You සැලකෙන්නෙ බහු වචන ලෙස )
- කර්තෘ ඒක වචන නම් ක්‍රියාපදය අගට S අකුරක් එකතු වෙනවා

We play cricket in the evening
වී ප්ලේ ක්‍රිකට් ඉන් දි ඊව්නින්
අපි හැන්දෑවට ක්‍රිකට් සෙල්ලම් කරනවා

She cook**s** well
ෂී කුක්ස් වෙල්
ඇය හොඳට උයනවා

They do business in Jaffna
දේ ඩූ බිස්නස් ඉන් ජැෆ්නා
ඔවුන් යාපනේ බිස්නස් කරනවා

He work**s** in a bank
හී ව(ර්)ක්ස් ඉන් අ බෑන්ක්
ඔහු බැංකුවක වැඩ කරනවා

My brother live**s** in England
මයි බ්‍රද(ර් ) ලිව්ස් ඉන් ඉංග්ලන්ඩ්
මගේ සහෝදරයා ජීවත් වෙන්නේ එංගලන්තයේ

You do it well
යු ඩූ ඉට් වෙල්
ඔයා ඒක හොදට කරනවා

මෙහි නැතාර්ථය බලමු

- කර්තෘ බහුවචන නම් නැතාර්ථයේදී ක්‍රියාපදය ඉදිරියට do not (ඩු නොට්) එකතු වෙනවා. (බොහෝවිට do not  කෙටි කර don’t - ඩෝන්ට් ලෙස භාවිතා වෙනවා)

I do not (don’t) like Hindi movies
අයි ඩු නොට් (ඩෝන්ට් )ලයික්  හින්දි මුවීස්
මම හින්දි චිත්‍රපටි වලට කැමති නෑ

We do not (don’t) eat meat
වී ඩු නොට් (ඩෝන්ට් ) ඊට් මීට්
අපි මස් කන්නේ නෑ

You don’t do it well
යු ඩෝන්ට් ඩු ඉට් වෙල්
ඔයා ඒක හොඳට කරන්නේ නෑ

They don ‘t work hard
දේ ඩෝන්ට් ව(ර්ක්) හාඩ්
ඔවුන් මහන්සියෙන් වැඩ කරන්නේ නැහැ

- කර්තෘ ඒකවචන නම් ක්‍රියාපදයට පෙර does not එකතු වෙනවා. <u>එසේ වීමේදී ක්‍රියාපදය අගට යෙදුන s අකුර  ඉවත් වෙනවා.</u> ( බොහෝවිට does not කෙටි කර deosn‘t - ඩස්න්ට්  ලෙස භාවිතා වෙනවා )

She read**s** novels
ශී රීඩ්ස් නවල්ස්
ඇය නව කතා කියවනවා

→

She does not (doesn’t) read novels
ෂී ඩස් නොට් (ඩස්න්ට් ) රීඩ්  නවල්ස්
ඇය  නවකතා කියවන්නේ නෑ

තවත් උදාහරන

He work**s** hard
හී වර්ක්ස් හාර්ඩ්
ඔහු මහන්සියෙන් වැඩ කරනවා

→

He doesn’t work hard
හී ඩස්න්ට් ව(ර්)ක් හාර්ඩ්
ඔහු  මහන්සියෙන් වැඩ කරන්නේ නෑ

Nimali want**s** to go abroad
නිමාලි වෝන්ට්ස් ටු ගෝ අබ්‍රෝඩ්.
නිමාලිට රට යන්න අවශ්‍යයි

→

Nimali doesn’t want to go abroad
නිමාලි  ඩස්න්ට් වෝන්ටු ගෝ අබ්‍රෝඩ්.
නිමලිට අවශ්‍ය නෑ රට යන්න.

- ප්‍රශ්නාර්ථය (කරනවද?) සෑදෙන්නේ හරිම සරල විදියට. කර්තෘ බහුවචන නම් do වාක්‍යයේ ඉදිරියට එනවා.එනම් කර්තෘට  පෙර යෙදෙනවා

Do you like cricket ?
ඩු යු ලයික් ක්‍රිකට් ?
ඔයා ක්‍රිකට් වලට කැමතිද?

Do they work hard?
ඩු දේ ව(ර්)ක්  හා(ර්)ඩ් ?
ඔවුන් මහන්සියෙන් වැඩ කරනවද?

Do sri Lankans love Hindi music?
ඩු ශ්‍රී ලන්කන්ස් ලව් හින්දි මියුසික් ?
ලාංකිකයෝ හින්දි මියුසික් වලට ආසද?

- කතෘ ඒකවචන නම් does වාක්‍යයේ ඉදිරියට එනවා ( (මෙහිදීත් අර s අකුර යෙදෙන්නේ නැහැ )

| | | |
|---|---|---|
| She cook**s** well<br>ෂී  කුක්ස් වෙල්<br>ඇය  හොඳට උයනවා | → | Does she cook well ?<br>ඩස් ෂී කුක් වෙල් ?<br>ඇය හොඳට උයනවද ? |
| He work**s** hard<br>හී  ව(ර්)ක්ස් හාඩ්<br>ඔහු මහන්සියෙන් වැඩ කරනවා | → | Does he work hard ?<br>ඩස් හී ව(ර්ක්) හා(ර්ඩ් ?<br>ඔහු මහන්සියෙන් වැඩකරනවද ? |
| His brother stud**ies** in abroad<br>හිස් බ්‍රද(ර්) ස්ටඩීස් ඉන් අබ්‍රෝඩ්<br>ඔහුගේ සහෝදරයා පිටරට ඉගෙන ගන්නවා | → | Does his brother study in abroad?<br>ඩස් හිස් බ්‍රද(ර්) ස්ටඩි ඉන් අබ්‍රෝඩ් ?<br>ඔහුගේ සහෝදරයා පිටරට ඉගෙන ගන්නවද ? |

( study වලට s එකතු වෙද්දී y අයින් වෙලා ies එකතු එනවා)

- සෘන ප්‍රශ්නාර්ථයේදි (කරන්නේ නැද්ද? ) do not, does not  වාක්‍යයේ ඉදිරියට පැමිණෙනවා.නමුත් ප්‍රයෝගික ව්‍යවහාරයේදී  බොහෝ විට භාවිතා වෙන්නේ ඒවායේ කෙටි රූපයන් වන don’t සහ doesn’t

Don’t You like cricket ?
ඩෝන්ට් යු ලයික් ක්‍රිකට් ?
ඔයා ක්‍රිකට් වලට කැමති නැද්ද?

Don’t they help you?
ඩෝන්ට් දේ හෙල්ප් යූ?
ඔවුන් ඔබට උදව් කරන්නේ නැද්ද?

Doesn’t she go to an English class?
ඩස්න්ට් ෂී ගෝ ටු ඇන් ඉන්ග්ලිෂ් ක්ලාස් ?
ඇය ඉංග්‍රීසි පන්තියකට යන්නේ නැද්ද ?

Doesn’t he do a job ?
ඩස්න්ට් හී ඩූ අ ජොබ් ?
ඔහු රස්සාවක් කරන්නේ නැද්ද?

හොඳයි අපි මීලග පාඩමේදී ප්‍රයෝගික ජීවිතයේදී සාමාන්‍යයෙන් කරන ක්‍රියා සදහා තවත් උදාහරණ බලමු. ඉන් පසු ඔබට තවත් පහසු වේවි තේරුම් ගන්න මෙම කාලය ප්‍රයෝගිකව භාවිතා වන ආකාරය

හොදයි මේ කාලයේ වාක්‍යය සෑදෙන රටාව දැන් ඔබ දන්නවා . එය වඩාත් හොදින් තහවුරු වීමට මේ අභ්‍යාසය කරන්න . කල්පනාවෙන් නිවැරදිව වාක්‍ය ගැලපීම පමණයි ඔබ කල යුත්තේ

Exercise 3

1. ඇය චතුර ලෙස ඉංග්‍රීසි කතා කරනවා
   (she ,speak, English , Fluently )

2. ඇය චතුර ලෙස ඉංග්‍රීසි කතා කරන්නේ නෑ

3. ඇය චතුර ලෙස ඉංග්‍රීසි කතා කරනවද?

4. ඇය චතුර ලෙස ඉංග්‍රීසි කතා කරන්නේ නැද්ද?

5.ඔවුන් ගොඩක් සල්ලි හම්බ කරනවා
   (They ,earn(අ(ර්)න්, a lot of money)

6.ඔවුන් ගොඩක් සල්ලි හම්බකරන්නේ නෑ

7. ඔවුන් ගොඩක් සල්ලි හම්බ කරනවද?

8. ඔවුන් ගොඩක් සල්ලි හම්බ කරන්නේ නැද්ද?

9. ඔහු කොම්පියුටර් අලුත්වැඩියා කරනවා
   (He, repair , computers

10. ඔහු කොම්පියුටර් අලුත්වැඩියා කරන්නෙ නැහැ

11. ඔහු කොම්පියුටර් අලුත්වැඩියා කරනවද ?

12. ඔහු කොම්පියුටර් අලුත්වැඩියා කරන්නෙ නැද්ද ?

LESSON 8 **SPOKEN ENGLISH**

මී ලඟට අපි ඉගෙන ගන්නේ ස්තුතියකට ප්‍රතිචාර දක්වන ආකාරය. සිංහලෙන් නම් ස්තුතියි කිව්වම එයට ප්‍රතිචාරයක් දක්වන්නේ නෑ. නිකම්ම සද්ද නැතුව ඉන්නවා. නමුත් ඉංග්‍රීසි භාෂාවේදී එයටත් ප්‍රතිචාර දක්වනවා. අපි ඊළගට බලමු කොහොමද එයට ප්‍රතිචාර දක්වන්නේ කියල.

You are welcome! - යූ ආ වෙල්කම් ! - ඔබේ ස්තුතිය පිලිගන්නවා.

Welcome! - වෙල්කම් ! - ස්තුතිය පිලිගන්නවා.

It's my pleasure - ඉට්ස් මයි ප්ලෙෂ(ර්) - එය මට සතුටක් (උදව් කිරීමට ලැබීම)

Don't mention it - ඩෝන්ට් මෙන්ෂන් ඉට් - එය සඳහන් කරන්න අවශ්‍ය නෑ.

That's alright - දැට්ස් ඕල් රයිට් - ඒක කමක් නෑ

That's nothing - දැට්ස් නතිං – ඒක මහා ලොකු දෙයක් නෙවෙයි

No problem - නෝ ප්‍රොබ්ලම් - ඒක ගැටළුවක් නෙවෙයි (උදව් කරන්න වීම )

මීලගට, අපි කලින් පාඩමේදී ඉගෙන ගත්ත ස්තුතිය ප්‍රකාශ කරන ආකාර සහ දැන් ඉගෙන ගත්ත ස්තුතියට ප්‍රතිචාර දක්වන ආකාර ප්‍රයෝගිකව භාවිතා වන දෙබස් ඛණ්ඩ කිහිපයක් ගනිමු.

Dialogue 1

A: Thank you for your help
තෑන්ක් යූ ෆෝ යුව(ර්) හෙල්ප්
ඔයාගේ උදව්වට ස්තුතියි

B: You’re welcome !
යූ ආ වෙල්කම්
ඔයාගේ ස්තුතිය පිලිගන්නවා

Dialogue 2

A: Thanks for your advice
තෑන්ක්ස් ෆෝ යුව(ර්) ඇඩ්වයිස්
ඔයාගේ උපදෙසට ස්තූතියි

B : You’re welcome !
යූ ආ වෙල්කම්
ඔයාගේ ස්තුතිය පිලිගන්නවා

Dialogue 3

A: Thank you very much for the nice meal
තෑන්ක් යූ වෙරි මච් ෆෝ ද නයිස් මීල්
රසවත් කෑම වේල සදහා ඔයාට ගොඩක් ස්තූතියි

B: You are welcome !
යූ ආ වෙල්කම්
ඔයාගේ ස්තුතිය පිලිගන්නවා

Dialogue 4

A: Thank you so much for the lovely gift
තෑන්ක් යූ සෝ මච් ෆෝ ද ලව්ලි ගිෆ්ට්
ලස්සන තෑග්ග වෙනුවෙන් ඔයාට ගොඩාක් ස්තූතියි

B: You’re welcome !
යූ ආ වෙල්කම්
ඔයාගේ ස්තුතිය පිලිගන්නවා

- ස්තුතියකට ප්‍රතිචාර දක්වන්න පාවිච්චි කරන්න පුලුවන් තවත් හොඳ යෙදුමක් තමයි " My pleasure !" (මයි ප්ලෙෂ(ර්) ). Pleasure කියන වචනේ තේරුම සතුට . මෙහිදී ඉන් අදහස් වෙන්නේ ඒ අකාරයෙන් උදව් කිරීමට ලැබීම සතුටක් වුනා කියන එක. අපි බලමු උදාහරණ දෙබස් කිහිපයක්

Dialogue 5

A: Thank you for organizing the trip
තෑන්ක් යූ ෆෝ ඕගනයිසිං ද ට්‍රිප්
ට්‍රිප් එක සංවිධානය කලාට ඔයාට ස්තූතියි

B: My pleasure !
මයි ප්ලෙෂ(ර්) !
(එය) මගේ සතුට !

Dialogue 6

A: Thank you very much for your time
තෑන්ක් යූ වෙරි මච් ෆෝ යුව(ර්) ටයිම්
ඔයාගේ කාලයට(ඔයාගේ කාලය යෙදවුවට) ගොඩාක් ස්තූතියි

B: My pleasure !
මයි ප්ලෙෂ(ර්) !
(එය) මගේ සතුට !

Dialogue 7

A: Thanks a lot for helping me
තැන්ක්ස් අ ලොට් ෆෝ හෙල්පින් මී
මට උදව් කලාට ගොඩාක් ස්තූතියි

B: My pleasure !
මයි ප්ලෙෂ(ර්) !
(එය) මගේ සතුට !

Dialogue 8

A: Thank you very much for explaining the lesson
තෑන්ක් යූ වෙරි මච් ෆෝ එක්ස්ප්ලේනිං ද ලෙසන්
පාඩම පැහැදිලි කලාට  ගොඩක් ස්තූතියි

B: My pleasure !
මයි ප්ලෙෂ(ර්) !
(එය) මගේ සතුට !

Dialogue 9

A: Thank you for explaining the lesson to me
තෑන්ක් යූ  ෆෝ එක්ස්ප්ලේනිං ද ලෙසන් ටු මී
මට පාඩම පැහැදිලි කලාට ඔයාට ස්තූතියි

B: Don't mention it !
ඩෝන්ට් මෙන්ෂන් ඉට් !
එය සඳහන් කරන්න අවශ්‍ය නෑ  !

Dialogue 10

A: Thanks for helping me with this work
තෑංක්ස් ෆෝ හෙල්පිං මී විත් දිස් ව(ර්)ක්
මේ වැඩේට මට උදව් කලාට ස්තූතියි

B: Don't mention it !
ඩෝන්ට් මෙන්ෂන් ඉට් !
එය සඳහන් කරන්න අවශ්‍ය නෑ !

Dialogue 11

A: Thank you so much for your advice.
තෑංක් යූ  සෝ මච්  ෆෝ යුව(ර්) ඇඩ්වයිස්
ඔයාගේ උපදේශයට ගොඩාක් ස්තූතියි

B: Don’t mention it !
ඩෝන්ට් මෙන්ෂන් ඉට් !
එය සඳහන් කරන්න අවශ්‍ය නෑ !

ස්තූති කිරීමකට ප්‍රතිචාර වශයෙන් මෙයත් කියන්න පුලුවන්.

- It’s nothing - ඉට්ස් නතිං - ඒක මහා දෙයක් නෙවෙයි / ඒක සුළු දෙයක් .

අපි සිංහලෙන් වුනත් සමහර අවස්ථාවල එහෙම කියනවා “ අනේ ඕක මොකක්ද ? / අනේ ඕක මහා ලොකු දෙයක්ද ? “කියලා . මෙය ඊට සමානයි . උදාහරණ බලමු

Dialogue 12

A: Thanks for coming with me
තෑංක්ස් ෆෝ කමිං විත් මී
මාත් එක්ක ආවට ගොඩක් ස්තූතීයි

B: It’s nothing!
ඉට්ස් නතිං
ඒක සුළු දෙයක්

Dialogue 13

A: Thank you for giving me your calculator.
තෑන්ක් යූ ෆෝ ගිවිං මී යුව(ර්) කැල්කියුලේට(ර් )
ඔයාගේ කැල්කියුලේට(ර්) එක මට දුන්නට ඔයාට ස්තූතියි

B: It’s nothing!
ඉට්ස් නතිං
ඒක සුළු දෙයක්

Dialogue 14

A: Thanks for spending your time for me
තෑංක්ස් ෆෝ ස්පෙන්ඩිං යුව(ර්) ටයිම් ෆෝ මී
මං වෙනුවෙන් ඔයාගේ කාලය වැය කලාට ස්තූතියි

B: It's nothing!
ඉට්ස් නතිං
ඒක සුළු දෙයක්

- සමහර අවස්ථා වල ස්තූතිය පිළිගන්න මේ යෙදුමත් ඉංග්‍රීසි කතා කරන්නන් භාවිතා කරනවා. No problem - නෝ ප්‍රොබ්ලම් . ඉන් අදහස් වෙන්නේ උදව් කිරීම මහා ලොකු දෙයක් / ලොකු ගැටළුවක් වුනේ නෑ කියන එක

Dialogue 15

A: Thanks for helping me with my homework.
තෑංක්ස් ෆෝ හෙල්පින් මී විත් මයි හෝම්ව(ර්)ක්
මගේ ගෙදර වැඩ වලට උදව් කලාට ස්තූතියි

B: No problem.
නෝ ප්‍රොබ්ලම්
ප්‍රශ්නයක් නෑ

Dialogue 16

A: Thank you for the pencil.
තැංකියූ ෆෝ ද පෙන්සිල්
පැන්සලට(පැන්සල දුන්නට) ස්තූතියි

B: No problem
නෝ ප්‍රොබ්ලම්
ප්‍රශ්නයක් නෑ

- තවත් සමහර අවස්ථා වල That 's okay - දැට්ස් ඕකේ කියන යෙදුමත් භාවිතා වෙනවා. එහිදීත් අදහස් වෙන්නේ උදව් කිරීම ලොකු ගැටළුවක් නොවූ බව

Dialogue 17

A: Thanks for carrying my bag.
තැන්ක්ස් ෆෝ කැරීන් මයි බැග්.
මගේ බෑග් එක අරන් ආවට ස්තුතියි

B: That's okay.
දැට්ස් ඔකේ
ඒක කමක් නෑ

පහත උදාහරණ දෙබස් වල ඔබට තවත් ලස්සන යෙදුම් කිහිපයක් ඉගෙන ගන්න පුළුවන් ස්තුති කිරීමට භාවිතා කල හැකි . ඒවා ඉතාම ස්වභාවික , ඉතාම ලස්සන භාෂා යෙදුම්.

Dialogue 18

A-: Chathuri ,Thank you for helping me in this ,That was a great help.
චතුරි, තෑන්ක් යූ ෆෝ හෙල්පින් මී ඉන් දිස් , දැට් වෝස් අ ග්‍රේට් හෙල්ප්.
මට මේකට උදව් කලාට ගොඩක් ස්තුතියි චතුරි , ඒක ලොකු උදව්වක් වුනා

B-: Oh Shanika ,That's not a big thing. Don't mention.
ඕ ශානිකා, දැට්ස් නොට් අ බිග් තිං . ඩෝන්ට් මෙන්ෂන්.
ඕ.. ශානිකා, ඒක මහා ලොකු දෙයක් නෙමෙයි. ඕක කියන්න අවශ්‍ය නෑ.

ශානිකා ස්තුතිය පල කරන්ට ඉඩ තිබෙන තවත් විදියක් මේ,

Dialogue 19

A-: I wouldn't have finished this on time without your help.That's very kind of you
අයි වුඩින්ට් හෑව් ෆිනිෂ්ඩ් දිස් ඔන් ටයිම් විතවුට් යුව(ර් ) හෙල්ප්. දැට්ස් වෙරි කයින්ඩ් ඔෆ් යූ
ඔයාගේ උදව් නැතුව මට මේක වෙලාවට ඉවර කරගන්න වෙන්නේ නෑ. ඔයා නම් හරිම කරුණාවන්තයි(ඔයාට ගොඩාක් ස්තුතියි)

B-: It was a pleasure, Shanika.
ඉට් වෝස් අ ප්ලෙෂ(ර්) , ශානිකා.
එය සතුටක් වුනා ශානිකා.(උදව් කරන්න ලැබීම) - (මෙය , යමෙකු තමන්ට කල උදව්වක් සම්බන්දයෙන් ස්තුති කල විට එයට ප්‍රතිචාර දක්වන්න ඉතාම හොඳ යෙදුමක් )

- යමක් උදෙසා /සඳහා ස්තුතියි යනුවෙන් සඳහන් කරද්දී “සඳහා” යන අර්ථය දීමට for යෙදෙනවා.ඊට පසුව ක්‍රියා පදයක් යෙදුනොත් එය ing රූපයෙන් තැබිය යුතුයි.

Thanks for your help - ඔයාගේ උදව්වට ස්තුතියි
Thanks for coming - ආවට ස්තුතියි

මේ තවත් අවස්තාවක්

Dialogue 20

A-: Thanks a lot for these documents,Saman.
තෑන්ක්ස් අ ලොට් ෆෝ දීස් ඩොකියුමන්ට්ස් ,සමන්
මේ ලියකියවිලි වලට ගොඩක් ස්තුතියි සමන්

B-: Don’t mention Nimali, And don’t hesitate to ask me if you need further help
ඩෝන්ට් මෙන්ෂන් නිමාලි, ඇන්ඩ් ඩෝන්ට් හෙසිටේට් ටු ආස්ක් මී ඉෆ් යූ නීඩ් ෆ(ර්)ද(ර්) හෙල්ප්.
ඕක කියන්න දෙයක් නෙමෙයි නිමාලි, ඒ වගේම ඔයාට තවත් උදව් ඕන නම් ඉල්ලන්න මැලි වෙන්න එපා (hesitate- පැකිලේනවා ) (futher - තව දුරටත් )

A-: That’s very kind of you. I cannot thank you enough
දැට්ස් වෙරි කයින්ඩ් ඔෆ් යූ. අයි කැනොට් තෑන්ක් යූ ඉනෆ්
ඔයා නම් හරිම කරුණාවන්තයි(ඔයාට ගොඩාක් ස්තුතියි). මට ඔයාට ඇතිවෙන්න ස්තුති කරන්න බැහැ ( මම ඔයාට කොහොම ස්තූති කරන්නද මන්දා )

- [I cannot thank you enough - මෙය ඉතාම හොඳ යෙදුමක් අතිශය ස්තුතිය පල කරන්න ]

තවත් අවස්ථාවක් ගනිමු. මෙය මුදල් ගෙවන කවුන්ටරයක්.

Dialogue 21

A-: Here's your balance. And this is the reciept
හියර්(ර්)ස් යුව(ර්) බැලන්ස්. ඇන්ඩ් දිස් ඉස් ද රිසිට්
මෙන්න ඔබේ බැලන්ස් ඒක. මෙන්න රිසිට් ඒක

B-: Thank you very much
තෑන්ක් යූ වෙරි මච්
ගොඩක් ස්තූතියි

A-: You are welcome
යූ ආ වෙල්කම්
ඔබේ ස්තූතිය පිලිගන්නවා

මේ වෙනත් අවස්ථාවක්

Dialogue 22

A.-: Thank you for coming with me. You were so helpful
තෑන්ක් යූ ෆෝ කමිං විත් මී. යූ වෝ(ර්) සෝ හෙල්ප්ෆුල්
මගෙත් එක්ක ආවට ඔයාට ස්තූතියි. ඔයා හරියට උදව් වුනා (helpful -උපකාරී)

B-: It's nothing . please tell me if you need help again
ඉට්ස් නතිං. ප්ලීස් ටෙල් මී ඉෆ් යූ නීඩ් හෙල්ප් අගේන්
ඒක සුළු දෙයක්(ඒක මොකක්ද?).ඔයාට ආපහු උදව් ඕන වුනොත් මට කියන්න

මේ වෙනස් සිද්ධියක්

Dialogue 23

A-: Thank for taking  time to explain this .Now it’s very clear to me.Thanks  a lot
තෑන්ක් ෆෝ ටේකින් ටයිම් ටු එක්ස්ප්ලේන් දිස්. නව් ඉට්ස් වෙරි ක්ලියු(ර්) ටු මී. තෑන්ක්ස් අ ලොට්.
මට මෙය පැහැදිලි කිරීමට කාලය ගැනීම ගැන ස්තුතියි. දැන් එය මට ඉතා පැහැදිලියි. බොහොම ස්තුතියි.

B-: Welcome! please ask again
වෙල්කම් ! ප්ලීස් ආස්ක් අගේන්
ස්තුතිය පිලිගන්නවා ! කරුණාකර නැවත ඉල්ලන්න (උදව්වක් ඕන වුනොත් )

තවත් උදාහරණයක්

Dialogue 24

A-: Thanks for taking trouble to come with me
තෑන්ක්ස් ෆෝ ටේකිං ට්‍රබල් ටු කම් විත් මී
මාත් එක්ක එන්න කරදර උනාට ස්තුතියි

B-: It wasn’t a problem at all.
ඉට් වොස්න්ට් අ ප්‍රොබ්ලම් ඇට් ඕල් (ඇටෝල්)
ඒක ප්‍රශ්නයක් වුනේ නෑ කොහෙත්ම

මේ උත්සව අවස්ථාවක ලබාදුන් තෑග්ගක් වෙනුවෙන් ස්තුති කිරීමක්

Dialogue 25

A-: Thank you so much for the gift.That was a lovely/nice/wonderful gift
තෑන්ක් යූ සෝ මච්  ෆෝ ද ගිෆ්ට්. දැට් වොස් අ ලව්ලි /නයිස් /වන්ඩෆුල් ගිෆ්ට්
මේ තෑග්ගට ගොඩාක්  ස්තුතියි. ඒක හරිම අපූරු තෑග්ගක් (wonderful - අපූරු, අනගි)

B-: You are welcome

යූ ආ වෙල්කම් !
ඔබේ ස්තුතිය පිලිගන්නවා

A-: And thanks for coming here and sharing this moment / Thanks for coming here and spending time with us
ඇන්ඩ් තෑන්ක්ස් ෆෝ කමිං හියර්) ඇන්ඩ් ෂෙයාරිං දිස් මෝමන්ට් / තෑන්ක්ස් ෆෝ කමින් හියර්) ඇන්ඩ් ස්පෙන්ඩිං ටයිම් විත් අස් (විතස්)
ඒවගේම මෙහෙ ඇවිල්ල මේ මොහොත බෙදා ගත්තට ස්තූතියි/මෙහෙ ඇවිල්ලා අපිත් එක්ක කාලේ ගත කලාට ස්තූතියි.

B-: That was a pleasure.
දැට් වොස් අ ප්ලෙෂර්)
ඒක සතුටක් වුනා.

වෙනත් උදාහරණයක්.

Dialogue 26

A-: Kamal, Thanks a lot for the book.
කමල් , තෑන්ක්ස් අ ලොට් ෆෝ ද බුක්
කමල් ,පොතට ගොඩාක් ස්තූතියි.

B-: It’s nothing!
ඉට්ස් නතිං !
ඒක සුළු දෙයක්.(ඒක මොකක්ද?)

කල උදව්වකට තවත් ස්තූති කිරීමක්.

Dialogue 27

A-: Thanks a lot Kamal,That was a great help
තෑන්ක්ස් අ ලොට් කමල්. දැට් වෝස් අ ග්‍රේට් හෙල්ප්
ගොඩාක් ස්තූතියි කමල්, ඒක ලොකු උදව්වක් වුනා

B-: Not at all, It’s nothing
නොට් ඇට් ඕල්, ඉට්ස් නතිං.
කොහෙත්ම නෑ. ඒක සුළු දෙයක්.(නෑ නෑ ඒක මොකක්ද?)

[මෙතැනදී කෙටියෙන් not at all (නොටැට් ඕල්) ලෙස පමනක් පිළිතුරු දිය හැකියි . එයත් මෙවැනි අවස්ථා වල නිතර භාවිතා වන යෙදුමක්]

Dialogue 28

A: Thanks a lot for your help Kamal
තෑන්ක්ස් අ ලොට් ෆෝ යුවර් හෙල්ප් කමල්
ඔබේ උදව්වට ගොඩාක් ස්තුතියි කමල්

B: Not at all
කොහෙත්ම නෑ
[මින් අදහස් කරන්නෙ එය විශාල කාර්යයක් නොවූ බව]

ඒ වගේම මෑතක සිට native speakers ල ස්තුතියකට ප්‍රතිචාර දක්වන්න මේ යෙදුමත් පාවිච්චි කරනවා

- No problem - නෝ ප්‍රොබ්ලම් -ප්‍රශ්නයක් නෑ

උදාහරනයක් ගෙන බලමු

Dialogue 29

A; I cannot thank you enough Kamal . I wouldn’t do this without your help
අයි කැනොට් තෑන්ක් යූ ඉනෆ් කමල්. අයි වුඩින්ට් ඩූ දිස් විතවුට් යුව(ර්) හෙල්ප්
මම ඔයාට කොහොම ස්තූති කරන්නද මන්ද කමල් . ඔයාගෙ උදව් නැතුව මම මේක කවදාවත් කරන්නෙ නැහැ

B: No problem Shanika , I am pleased that I was able to help you
නෝ ප්‍රොබ්ලම් ශානිකා , අයෑම් ප්ලීස්ඩ් දැට් අයි වෝස් ඒබල් ටු හෙල්ප් යූ
ගැටලුවක් නෑ ශානිකා , මට සතුටුයි මට ඔයාට උදව් කරන්න පුලුවන් වෙච්ච් එක ගැන

ඒ වගේම සමහරැ Thank you කිව්වම පෙරලා Thank you කියලා පිලිතුරැ දෙන අවස්ථාත් තියෙනවා, ඒ ස්තුතිය පල කිරීම දෙපැත්තටම හිමි නම්. ඒ කියන්නේ සාප්පුවකින් බඩුවක් ගන්න පාරිභෝගිකයෙකුට මුදල් අයකැමි(cashier) Thank you කියනවා. පාරිභෝගිකයාත්(customer) පෙරලා "Thank you" කියනවා එයාට දුන්නු සේවයට

Dialogue 30

Cashier - Thank you! Have a nice day.
තෑන්ක් යූ! හැව් අ නයිස් ඩේ.
ස්තුතියි ! සුභ දවසක්.

Customer - Thank you! You too.
තෑන්ක් යූ! යූ ටූ.
ස්තුතියි ! ඔබටත්(සුභ දවසක් )

**Vocabulary 8**

Bathe – බේද් – නානවා

Bath – බාත් – නෑම , ස්නානය

Shower – ෂව(ර්) – වතුර මල / වතුර මලෙන් නෑම හෝ ඇඟ සේදීම

Get ready – ගෙට් රෙඩි – සූදානම් වෙනවා

Get dressed – ගෙට් ඩ්‍රෙස්ඩ් – ඇඳුම් ඇඳ ගන්නවා

Normally – නෝමලි – සාමාන්‍යයෙන්

Usually – යූෂුවලි – සාමාන්‍යයෙන්

Village – විලේජ් – ගම

Hometown – හෝම්ටවුන් – උපන් ගම

Arrive – අරයිව් – ළඟා වෙනවා

Newspaper – නිව්ස්පේප(ර්) – පුවත්පත

Prepare – ප්‍රිපෙයා – සූදානම් වෙනවා , සූදානම් කරනවා

Preparation – ප්‍රිපරේෂන් – සූදානම

Business – බිස්නස් – ව්‍යාපාරය

Read – රීඩ් – කියවනවා

Novel – නවල් – නවකතාව

Study – ස්ටඩි – අධ්‍යයනය කරනවා

Studies – ස්ටඩීස් – අධ්‍යයන කටයුතු , ඉගෙනුම් කටයුතු

Welcome – වෙල්කම් – පිලිගන්නවා , පිළිගැනීම

Pleasure – ප්ලෙෂ(ර්) – සතුට

Mention – මෙන්ෂන් – සඳහන් කරනවා

Alright – ඕල්රයිට් – හරි / හොඳයි

Nothing – නතිං – කිසිවක් නැහැ

Advice – ඇඩ්වයිස් – උපදෙස

Meal – මීල් – ආහාර වේල

Gift – ගිෆ්ට් – තෑග්ග

Trip – ට්‍රිප් – ගමන

Explain – එක්ස්ප්ලේන් – පැහැදිලි කරනවා

Lesson – ලෙසන් – පාඩම

Calculator – කැල්කියුලේට(ර්) – විදුලි  ගණක යන්ත්‍රය

Spend – ස්පෙන්ඩ් – වැය කරනවා

Carry – කැරී  – රැගෙන යනවා

Document – ඩොකියුමන්ට් – ලේඛනය

Further – ෆ(ර්)ද(ර්) – තවදුරටත්

Balance – බැලන්ස් – ඉතිරි මුදල , සමබරතාව

Receipt – රිසීට් – ලදුපත

Clear – ක්ලිය(ර්) – පැහැදිලි

Wonderful – වන්ඩ(ර්)ෆුල් – අපූරු

fluent - ෆ්ලුවන්ට් - (භාෂාවක ) චතුර

fluently - ෆ්ලුවන්ට්ලි - චතුර ලෙස